# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2018 අංක 19 දරන ජාතික විගණන පනත

---

**[සහතිකය සටහන් කළේ 2018 ජූලි මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2018 ජූලි මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල : රු. 52.00** **තැපැල් ගාස්තුව : රු. 105.00**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2018 අංක 19 දරන ජාතික විගණන පනත**

[සහතිකය සටහන් කළේ 2018 ජූලි මස 17 වන දින]

එල්. ඩී.— ඕ. 3/2015

**විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා ද; ජාතික විගණන කාර්යාලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටුවීම සඳහා ද; රාජ්‍ය මුල්‍ය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** (1) මේ පනත 2018 අංක 19 දරන ජාතික විගණන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

(2) මේ පනතේ විධිවිධාන ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින්මතු 'නියමිත දිනය' යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

**2.** විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි විගණනය සහ ඒ හා සම්බන්ධ කාරණා සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153, 153අ, 153ආ, 153ඇ, 153ඈ, 153ඉ, 153ඊ, 153උ, 153ඌ සහ 154 යන ව්‍යවස්ථාවල පවතින විධිවිධාන, මේ පනතේ විධිවිධාන සහ අදාළ විය හැකි පරිදි වෙනත් යම් ලිඛිත නීතියක අඩංගු වී ඇති විධිවිධාන අදාළ වන්නේ ය.

විගණන සම්බන්ධව අදාළ වන නීති.

## I වන කොටස

### විගණකාධිපතිවරයා විසින් සිදු කරන විගණනවල විෂය පථය

**3.** (1) විගණකාධිපතිවරයා විසින්-

විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්ට අදාළ විගණනයේ විෂය පථය.

(අ) ඒකාබද්ධ අරමුදල වෙත ලැබෙන සියලු ආදායම් සහ ඒකාබද්ධ අරමුදලෙන් වන සියලු වියදම් විගණනය කරනු ලැබිය යුතු ය;

(ආ) විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි ගිණුම්වල වියපැහැදම් කරනු ලැබ ඇති බවට පෙන්නුම් කරනු ලබන මුදල්, ඒවා අදාළ කරගෙන ඇත්තා වූ හෝ අයකරගෙන ඇත්තා වූ සේවා හෝ කාර්ය සඳහා නීත්‍යානුකූලව ලබාගෙන සහ අදාළ කරගෙන තිබේ ද යන්න පිළිබඳ විමසා දැනගත යුතු ය;

(ඇ) වියදම්, ඒවා පාලනය කරනු ලබන අධිකාරයට අනුකූල වන්නේ ද යන්න පිළිබඳ තීරණය කළ යුතු ය; සහ

(ඈ) එක් එක් විගණනයේ දී, ආදායම්, වියදම්, ගනුදෙනු හා සිද්ධීන් පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(2) විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලද විගණනයක විෂය පථයට විගණනය කරනු ලබන ආයතනයන්හි ගිණුම්, මූල්‍යයන්, මූල්‍ය තත්ත්වය සහ රාජ්‍ය මූල්‍යවල සහ දේපළවල විචක්ෂණ කළමනාකරණය පරීක්ෂා කිරීම ඇතුළත් වන්නේ ය.

(3) විගණකාධිපතිවරයා මේ පනතේ විධිවිධාන ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිව යුතු ය.

මහජනයා විසින් විගණකාධිපති-වරයාට දැනුම් දෙනු ලැබීම.

**4.** 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, විගණනය කරනු ලබන ආයතනයට අදාළ ඕනෑම කාරණයක් පිළිබඳව, එම කරුණු සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි සහිතව මහජනතාව අතරින් යම් අයෙකු විගණකාධිපතිවරයාව ලිඛිතව දැනුවත් කර ඇත්නම්, එම කරුණු විගණකාධිපතිවරයා විසින් පරීක්ෂා කළ හැකි අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු ය.

අදාළ කරගනු ලැබිය හැකි විගණන ප්‍රමිති.

**5.** (1) 29 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික විගණන කාර්යාලය විසින් භාරගනු ලබන විගණන සඳහා, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් තීරණය කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අදාළ විය යුතු ය.

(2) කාර්ය සාධන විගණන, පාරිසරික විගණන, තාක්ෂණික විගණන සහ වෙනත් යම් විශේෂ විගණන සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල කිසිදු විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවක දී, එම විගණන සම්බන්ධයෙන් අදාළ විය යුතු බවට උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානය මගින් තීරණය කරන ලද උත්තරීතර විගණන ආයතන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතිවල ප්‍රතිපාදන, දේශීය අවශ්‍යතාවලට සරිලන පරිදි වූ සංශෝධන සහිතව අදාළ විය යුතු වන පරිදි විගණන සේවා කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

II වන කොටස

**විගණකාධිපතිවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය**

විගණකාධිපති-වරයාගේ කාර්ය සහ කර්තව්‍ය.

**6.** (1) විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන යම් තැනැත්තකු විසින් යම් විගණනයක් සිදු කරනු ලැබීමේ දී-

(අ) විගණනය කරනු ලබන ආස්ථිත්‍යවල භාණ්ඩාගාර සහ මූලික හෝ උපකාරක ගිණුම් ඇතුළුව එවැනි යම් විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක ගිණුම් පරීක්ෂා කරනු ලැබිය යුතු ය;

(ආ) ස්වකීය කර්තව්‍යයන් දක්වා විහිදෙන්නා වූ යම් ගනුදෙනුවලට සම්බන්ධවන හෝ ඒවාට පදනම් වන හෝ අන්‍යාකාරයකින් අදාළවන යම් ගිණුම්, පොත්, ලියවිලි සහ වෙනත් ලේඛන, තමාගේ අධීක්ෂණය සඳහා ඔහු විසින් නියම කරනු ලබන යම් ස්ථානයකට යවන ලෙස නියම කරනු ලැබිය යුතු ය;

(ඇ) විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයාගෙන් තමා විසින් අවශ්‍ය බවට සලකන ආකාරයට ප්‍රශ්න කිරීම හෝ යම් නිරීක්ෂණ සිදු කිරීම කරනු ලැබිය යුතු අතර, යම් ගිණුමක් හෝ වාර්තාවක් සෑදීමට ඔහුට අවශ්‍ය විය හැකි එවැනි යම් තොරතුරු ඉල්ලා සිටිය යුතු ය;

(ඈ) විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ සමූහය-

(i) අදාළ වන මූල්‍ය තත්ත්වය වාර්තා කරන ප්‍රමිතීන්ට අනුකූල වන බවට;

(ii) සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ කටයුතු සම්බන්ධයෙන් සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් වන පරිදි සකස් කර ඇති බවට;

(iii) ඉකුත් වූ වර්ෂය සමග අනුරූප වන බවට; සහ

(iv) පසුගිය වර්ෂයේ දී විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලද යම් නිර්දේශ එයට ඇතුළත් කර ඇති බවට,

සහතික විය යුතු ය.

(2) විගණකාධිපතිවරයා විසින්, රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවට සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ස්වකීය කර්තව්‍යයන් වඩාත් කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා සහාය විය යුතු ය. පාර්ලිමේන්තුවේ අනෙකුත් සියලු කාරක සභා සඳහා ද එවැනි සහාය අවශ්‍ය වන අවස්ථාවල දී විගණකාධිපතිවරයා විසින් සිය සහාය ලබාදිය යුතු ය.

(3) 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, එය නොසලකා, යම් රාජ්‍ය සංස්ථාවක්, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඍජුව හෝ වක්‍රව රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් භාරව සිටින අමාත්‍යවරයා විසින් මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සහ විගණකාධිපතිවරයා විමසා එම විගණනය කරනු ලබන ආස්ථිත්‍යවල ගිණුම් විගණනය කිරීම පිණිස සුදුසුකම්ලත් විගණකවරයකු හෝ විගණකවරුන් පත් කරනු ලැබිය හැකි ය. එම පත්වීම අමාත්‍යවරයා විසින් සිදුකරනු ලැබ ඇති අවස්ථාවක දී, විගණකාධිපතිවරයා විසින් ලිඛිතව, එම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළව විගණකාධිපතිවරයාගේ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට එම විගණකවරයාගේ හෝ විගණකවරුන්ගේ සේවාවන් භාවිත කරන ලෙස තමා විසින් යෝජනා කරන බවට එම විගණකවරයා හෝ විගණකවරුන් වෙත දන්වනු ලැබිය හැකි අතර ඉන්පසුව, එම විගණකවරයා හෝ විගණකවරුන් විසින් විගණකාධිපතිවරයාගේ විධානය සහ පාලනය යටතේ ක්‍රියාකරනු ලැබිය යුතු ය.

විගණනයක් සිදු කිරීමේ දී විගණකාධිපති-වරයාගේ බලතල.

**7.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාව යටතේ විගණකාධිපතිවරයාට පවරා ඇති බලතල සහ කර්තව්‍යවලට අමතරව, යම් විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ යම්

තැනැත්තකු විසින් පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය:—

(අ) විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක කටයුතුවලට අදාළ ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා හෝ වෙනත් තොරතුරු වෙත ප්‍රවේශ වීම හෝ එම වාර්තා හෝ තොරතුරු කැඳවීම;

(ආ) මේ පනත යටතේ වූ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය බවට විගණකාධිපතිවරයා විසින් සලකනු ආකාරයේ යම් තොරතුරු හෝ ලේඛන සන්තකයේ තබාගෙන සිටින බවට විශ්වාස කිරීමට විගණකාධිපතිවරයාට සාධාරණ හේතු පවතින යම් තැනැත්තකුගෙන් ලිඛිත හෝ වාචික ප්‍රකාශ ලබා ගැනීමට, කැඳවීමට සහ සේවයේ යෙදී සිටිය හැකි හෝ එසේ නොවන යම් තැනැත්තකුට යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබීම;

(ඇ) විගණනය කරනු ලබන ආස්ථිත්‍යය සන්තකයේ පවතින හෝ නොපවතින යම් ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා පරීක්ෂා කිරීම සහ ඒවායෙහි පිටපත් ලබා ගැනීම හෝ උද්ධෘත ලබා ගැනීම සහ තොරතුරු සෝදිසි කිරීම;

(ඈ) යම් තැනැත්තකුගේ ගිණුමක් වෙත, විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අයත් මුදල් වංචා සහගත ලෙස, අනිසි ලෙස හෝ සාවද්‍ය ලෙස ගෙවා ඇති බවට විගණකාධිපතිවරයා විසින් විශ්වාස කිරීමට හේතු පවතින අවස්ථාවක දී, අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයෙන් අවසර ලබා ගැනීමෙන් පසුව, එවැනි යම් තැනැත්තකුගේ, මූල්‍ය ආයතනයක පවතින ගිණුම්, ගනුදෙනු හෝ ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම සහ විගණනය කිරීම;

(ඉ) (ඈ) ඡේදයේ සඳහන් කරන ලද යම් තැනැත්තකුගේ ගිණුමකට, ගනුදෙනුවකට, ගනුදෙනු කිරීමකට හෝ ක්‍රියාකාරකමකට අදාළ යම් ලේඛන ඉදිරිපත් කරන ලෙස හෝ තොරතුරු සපයන ලෙස යම් මූල්‍ය ආයතනයක යම් නිලධරයකු වෙත නියම කිරීම සහ අවශ්‍ය වේ නම් එසේ සපයන ලද යම් ලේඛනයකින් පිටපත් ලබා ගැනීම;

(ඊ) එවැනි නිලධරයකු විසින් සිදු කරන ලද විගණනයක ප්‍රතිඵල පිළිබඳව, එක් එක් විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ පාලක මණ්ඩලයේ අදහස් ලබා ගැනීම;

(උ) විගණන අරමුදලින් ප්‍රසාද දීමනා සහ දිරි දීමනා ගෙවීම; සහ

(ඌ) මේ පනතේ කාර්ය ඉටු කර ගැනීම සඳහා ඒ හා සම්බන්ධිත හෝ ආනුෂංගික වෙනත් සියලු කටයුතු සිදු කිරීම.

(2) හෙළිදරව් කිරීම මගින් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට අගතිගාමී වන්නා වූ යම් තොරතුරක්, ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව විගණකාධිපතිවරයා විසින් පුද්ගලිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(3) සෑම තැනැත්තකු විසින් ම මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකරනු ලැබිය යුතු අතර එසේ අනුකූලව ක්‍රියා කිරීම, රහස්‍යභාවය, රහසිගතභාවය හෝ තොරතුරු හෙළිදරව් නොකිරීමට අදාළ යම් ලිඛිත නීතියක් උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයෙහි කාර්ය සඳහා විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින්, යම් තැනැත්තකු කැඳවනු ලැබ ඇති අවස්ථාවක දී සහ එකී තැනැත්තාට නොවැළැක්විය හැකි තත්ත්වයක් හේතුවෙන් පෞද්ගලිකව පෙනී සිටීමට නොහැකි අවස්ථාවක දී, ඔහු විසින් ඒ වෙනුවෙන් විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටීම සඳහා, විගණකාධිපතිවරයාගේ අනුමැතිය ඇතිව එම විෂයය පිළිබඳ මනා දැනුමක් ඇති වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය.

(5) ස්වකීය කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද යම් නිලධරයකු, වෙනත් යම් තැනැත්තකුගේ හෝ අධිකාරියක මැදිහත් වීමකට හෝ බලපෑම් කිරීමකට යටත් නොවිය යුතු ය.

විගණකාධිපතිවරයා විසින් ම ඉටු කළ යුතු බලතල, කාර්ය සහ කර්තව්‍ය.

8. විගණකාධිපතිවරයා විසින් ම පහත දැක්වෙන බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම කළ යුතු යඃ-

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4) ව්‍යවස්ථාවේ සඳහන් පරිදි සුදුසුකම්ලත් විගණකවරයකු හෝ තාක්ෂණික, වෘත්තීය හෝ විද්‍යාත්මක විශේෂඥ ඥානය සහිත යම් ආයතනයක් පත් කිරීම;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව යටතේ ස්වකීය කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම සහ සිදුකිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කිරීම;

(ඇ) විගණන අරමුදල පරිපාලනය කිරීම.

තොරතුරු හෙළිදරව් නොකළ යුතු බව.

**9.** (1) විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්, මේ පනත යටතේ යම් ධුරයකට පත්කරනු ලැබූ යම් තැනැත්තකු හෝ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා එම තැනැත්තාට සහාය වන වෙනත් යම් තැනැත්තකු හෝ විගණකාධිපතිවරයා විසින් තත්කාර්යය සඳහා සේවයේ යොදවනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු, මේ පනත යටතේ වූ ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ දී හැර මේ පනත යටතේ තම කාර්යය ඉටුකිරීමේ දී තමාට දැනගැනීමට ලැබුණු යම් තොරතුරක් හෙළිදරව් නොකළ යුතු අතර-

(අ) පාර්ලිමේන්තුව විසින් කරනු ලබන ඉල්ලීමක් මත හෝ අධිකරණයේ ආඥාවක් අනුව හෝ (ආ) ඡේදයට යටත්ව යම් ලිඛිත නීතියක විධිවිධාන බලාත්මක කිරීම සඳහා හැර යම් තොරතුරක් හෙළිදරව් කරන ලෙස යම් තැනැත්තකු විසින් බලපෑම් කරනු ලැබීමට ලක් නොවිය යුතු ය;

(ආ) යම් තොරතුරක් ලබාදෙන අදාළ තැනැත්තාගේ හෝ ආයතනයේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගැනීමෙන් තොරව සහ නියම කරනු ලැබිය හැකි පරිදි විගණකාධිපතිවරයා විසින් එම තොරතුරුවලට අදාළව පිළියෙල කරන ලද වාර්තාවක් හෝ ප්‍රකාශයක්, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනතුරු, එම තොරතුරු හෙළිදරව් කිරීමට නියම කරනු ලැබ ඇති යම් නීතියක් යටතේ එම තොරතුරු හෙළිදරව් නොකළ යුතු ය; සහ

(ඇ) මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති පරිදි රහස්‍යභාවය පිළිබඳ දිවුරුමක් සිදු කරනතුරු, කිසිම තැනැත්තකු තම

ධුරයේ කාර්ය ආරම්භ නොකළ යුතු ය. විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින්, කථානායකවරයා ඉදිරිපිට දී රහස්‍යභාවය පිළිබඳ දිවුරුම සිදු කරනු ලැබිය යුතු අතර මෙහි විශේෂිතව දක්වා ඇති අන් සෑම තැනැත්තකු ම විගණකාධිපතිවරයා ඉදිරිපිට දී එම දිවුරුම සිදුකරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, එවැනි යම් තැනැත්තකුට එවැනි කරුණක් සන්නිවේදනය කිරීම හෝ එවැනි කරුණකට අදාළ පොත්, ලියවිලි හෝ වෙනත් වාර්තාවලට ප්‍රවේශ වීමට අධිකාරී නොලත් පුද්ගලයකුට ඉඩ හරිනු ලබන යම් සාමාජිකයකු හෝ තැනැත්තකු හෝ සුදුසුකම්ලත් විගණකවරයකු වරදකට වරදකරු වන්නේ ය.

## III වන කොටස

## විගණකාධිපතිවරයා විසින් වාර්තා සහ ප්‍රකාශ ඉදිරිපත් කිරීම

විගණකාධිපති-වරයා විසින් වාර්ෂිකව පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව.

**10.** (1) විගණකාධිපතිවරයා විසින්, එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව, ලිඛිත නීතිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාවන් තුළ දී, ඔහු විසින් එම වර්ෂය තුළ දී සිදුකරනු ලැබූ විගණනවල ප්‍රතිඵල පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, ඔහු විසින් සිදුකළ නිගමන සම්බන්ධයෙන් විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් විසින් ප්‍රකාශ කරන ලද යම් නිරීක්ෂණයක් එම වාර්තාවට ඇතුළත් කළ යුතු ය.

(2) නිශ්චිත වර්ෂයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබීම, ලිඛිත නීතිය යටතේ නිශ්චිතව සඳහන් කරන ලද කාලසීමාවන් තුළ විගණකාධිපතිවරයා විසින් සම්පූර්ණ කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව, විගණකාධිපතිවරයා විසින් ජාතික විගණන කාර්යාලයේ නිල වෙබ් අඩවිය මගින් එය ලබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය හැකි ය.

සම්පිණ්ඩන වාර්තාව සහ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තා.

**11.** (1) 12 වන වගන්තියේ සඳහන් කරන ලද ආස්ථිත්‍යයක් හැර යම් විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් විසින් ඉදිරිපත් කරන ලද යම් මූල්‍ය ප්‍රකාශයක් හෝ යම් ගිණුමක් සම්බන්ධයෙන්, විගණකාධිපතිවරයා විසින්, විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට

එක් එක් මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් පසුව මාස පහක් තුළ දී සම්පිණ්ඩන වාර්තාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) අදාළ විගණනය කරනු ලබන ආස්ථිත්‍යය පවරා ඇති අමාත්‍යවරයාට සහ මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාට පිටපත් සහිතව එක් එක් මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් මාස පහක් ඇතුළත එක් එක් විගණනය කරන ලද ආස්ථිත්‍යයන්හි පාලක මණ්ඩලයට විගණකාධිපතිවරයා විසින් වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

සංස්ථා සහ සමාගම්වලට අදාළ විගණකාධිපති-වරයාගේ වාර්තාවේ අඩංගු වන කරුණු.

**12.** රාජ්‍ය සංස්ථාවක් වන හෝ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් කොටස් වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දරනු ලබන සමාගමක අනුමත වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් අදාළ ලේඛන සහ තොරතුරු විගණකාධිපතිවරයා වෙත ලැබී මාස තුනක් ඇතුළත, සිය වාර්ෂික වාර්තාවේ පළකිරීම සඳහා එම රාජ්‍ය සංස්ථාවේ හෝ සමාගමේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා වෙත විගණකාධිපතිවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, විගණකාධිපතිවරයාගේ එම වාර්තාවෙහි—

(අ) විගණනයේ කාර්ය සඳහා විගණකාධිපතිවරයාගේ මතය අනුව අදාළ වන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් ඔහු විසින් සාධාරණව ලබාගෙන තිබේ ද යන්න;

(ආ) ආස්ථිත්‍යයේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහය පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්වන ආකාරයෙන්, අවස්ථාවෝචිත පරිදි, විගණන ප්‍රමිති කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට හෝ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට හෝ අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර තිබේ ද යන්න;

(ඇ) ආස්ථිත්‍යයේ සහ එහි පාලිත සහ ආශ්‍රිත සමාගම්වල මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පෙන්වන ආකාරයෙන්, අවස්ථාවෝචිත පරිදි, විගණන ප්‍රමිති කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට හෝ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ

ගිණුම්කරණ ප්‍රමිතීන්වලට හෝ අනුකූලව එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර තිබේ ද යන්න;

(ඇ) එම ආස්ථිතයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට එම ආස්ථිතය සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් වන යම් සම්බන්ධයක් තිබේ ද යන්න සහ තත්ත්වය එසේ නම් එම සම්බන්ධතාවයේ ස්වභාවය සහ ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ අදහස් සහ මත පැවසුම්;

(ඉ) විගණකාධිපතිවරයා විසින් පරීක්ෂා කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශයක් පිළිබඳව තත්වාගණනය කළ ව්‍යාචනය කළ, අහිතකර නැතහොත් සමාන විගණන මතයක් ප්‍රකාශ කිරීමට හේතු;

(ඊ) යම් අදාළ ලිඛිත නීතියකට හෝ විගණනය කරනු ලබන ආස්ථිතයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විගණනය කරනු ලබන ආස්ථිතය ක්‍රියාකර තිබේ ද නැතහොත් එසේ ක්‍රියාකර නොමැති ද යන්න;

(උ) විගණනය කරනු ලබන ආස්ථිතය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර තිබේ ද යන්න;

(ඌ) විගණනය කරනු ලබන ආස්ථිතයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර තිබේ ද යන්න; සහ

(එ) මෙම පනතේ කාර්ය ඉටු කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් යම් කරුණක්,

සඳහන් කළ යුතු ය.

විශේෂ වාර්තා.

**13.** යම් මුදල් වර්ෂයක් තුළ, විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලද ඕනෑම විගණනයක් පිළිබඳව විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු අතර, එම වාර්තා ජාතික විගණන කාර්යාලයේ නිල වෙබ් අඩවිය මගින් මහජනයාට ලබා

ගැනීමට සැලැස්විය යුතු ය. තව ද යම් වාර්තාවක්, තොරතුරක්, ලේඛනයක්, පොතක්, ගොනුවක් හෝ පරිගණක ආශ්‍රයෙන් ලබාගත් පිටපතක් ඔහු විසින් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත ලබා දෙනු ලැබ ඇත්නම් හෝ එසේ ලබා දීමට අදහස් කරනු ලබන්නේ නම් එම වාර්තාව ප්‍රකාශයට පත් නොකළ යුතු ය.

**14.** විගණකාධිපතිවරයා විසින් සෑම මුදල් වර්ෂ තුනක කාලසීමාවක් අවසන් වීමෙන් පසුව මාස නවයක් ඇතුළත සෑම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක ම තත්ත්ව වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතු ය. මෙම වාර්තාවේ ඇතුළත් විය යුතු කරුණු අතර හඳුනාගත් ප්‍රධාන ඌනතා, ඒ සඳහා විගණකාධිපතිවරයා විසින් කරන ලද නිර්දේශ සහ විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන් විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග තිබිය යුතු අතර පාර්ලිමේන්තුවට ඒ වාර්තාව භාර දෙන අවස්ථාව වන විට ඒ පිළිබඳව පැවති තත්ත්වය ගැන ද සඳහන් විය යුතු ය. ත්‍රෛවාර්ෂික වාර්තා.

**15.** (1) රජයේ මූල්‍ය ප්‍රකාශ රජයේ එක් එක් මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඉකුත් වීමට පෙර භාණ්ඩාගාර ලේකම්වරයා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. රජයේ මූල්‍ය ප්‍රකාශ විගණකාධිපති-වරයා වෙත ඉදිරිපත් කිරීම.

(2) විගණනය කරන ලද රජයේ මූල්‍ය ප්‍රකාශ සහ ඒ සම්බන්ධව විගණකාධිපතිවරයාගේ මතය ද සහිතව මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව, පසුව එළඹෙන මුදල් වර්ෂයේ මැයි මස 31 වන දිනට පෙර මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු ය.

(3) මෙම වගන්තියේ කාර්ය සඳහා-

(අ) "රජයේ මූල්‍ය ප්‍රකාශය" යන්නට-

(i) එම මුදල් වර්ෂය තුළ සිදුවූ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, රජයේ වත්කම් සහ වගකීම් පෙන්නුම් කරනු ලබන එම මුදල් වර්ෂය සඳහා වන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් සහ එම මුදල් වර්ෂය තුළ වූ මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශයක් සහ අදාළ කරගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඊට අදාළ සටහන් ද සමඟ වන එම වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාව ද;

(ii) එකී මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් තම මතය ප්‍රකාශ කිරීමට විගණකාධිපතිවරයාට අවශ්‍ය විය හැකි වෙනත් යම් ලේඛන; සහ

(iii) එකී මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබූ විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්වල ලැයිස්තුගත කරන ලද ප්‍රකාශයක්,

ඇතුළත් විය යුතු ය.

(ආ) "රජය" යන්නෙන්, වාර්ෂික විසර්ජන පනත මගින් අරමුදල් වෙන් කරනු ලබන රජයේ ආයතන අදහස් වේ. ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මේ වගන්තියේ කාර්ය සඳහා රජය වශයෙන් සලකනු ලැබිය හැකි වෙනත් ආයතන ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය;

(ඇ) "කාර්ය සාධන වාර්තාව" යන්නට, ඉටුකර ගත් අරමුණු, අනාගත අපේක්ෂා, ප්‍රධාන කාර්ය සාධන දර්ශක සහ සම්පත් භාවිත කිරීම සම්බන්ධයෙන් වන ප්‍රගතිය ඇතුළත් වේ.

විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි වාර්ෂික මූල්‍ය ප්‍රකාශ.

**16.** (1) සෑම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් විසින් ම එම ආස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

(2) එක් එක් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව සහ වෙනත් යම් නිශ්චිතව සඳහන් ආයතන සහ කොමිෂන් සභා සම්බන්ධයෙන් වූ වාර්ෂික විසර්ජන ගිණුම, ආදායම් ගිණුම සහ අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාළ ගිණුම් ඇතුළු වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් සෑම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මගින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම ආස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමග ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

17. සෑම රාජ්‍ය සංස්ථාවක් විසින් ම හෝ රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් එහි කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරන සෑම සමාගමක් විසින් ම, ස්වකීය වාර්ෂික වාර්තාවෙහි– රාජ්‍ය සංස්ථාවක හෝ සමාගමක වාර්ෂික වාර්තාව.

(අ) එම ආස්ථිත්‍යයේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා වෙත 12 වන වගන්තිය යටතේ විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව;

(ආ) අදාළ වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාව;

(ඇ) අදාළ වර්ෂය සඳහා වූ ආස්ථිත්‍යයේ වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ; සහ

(ඈ) පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් සහ පරිසරයට යම් සෘණාත්මක බලපෑමක් සිදුවන්නේ නම් එය අවම කර ගැනීම පිළිබඳ විස්තර සහ අවශ්‍ය අවස්ථාවල දී, පාරිසරික සහ ආපදා බලපෑම් ඇගයීම් ඇතුළත් විය හැකි තිරසාර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාවක්,

ඇතුළත් කළ යුතු ය.

18. (1) විගණනයක් සිදු කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් පහත දැක්වෙන විගණනය කරනු ලබන යම් ආස්ථිත්‍යයන්ගෙන් ගාස්තුවක් අය කරනු ලැබිය යුතු ය– විගණන ගාස්තු.

(අ) රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත අරමුදල් හෝ මණ්ඩල;

(ආ) යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළෙඳ ව්‍යාපාර හෝ වෙනත් ව්‍යාපාර; සහ

(ඇ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන යම් සමාගමක්.

(2) අය කළ යුතු ගාස්තුව, විගණකාධිපතිවරයා විසින්, මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා

විමසා විගණනය කරනු ලබන ආස්ථිතිය පවරා ඇති අදාළ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව තීරණය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ විගණකාධිපතිවරයාට ලැබෙන ගාස්තුවෙන් විගණනය සිදු කිරීමේ දී වැය වූ මුදල අඩු කර, ඉතිරි මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) විගණනය කරනු ලබන ආස්ථිතියක් විසින් විගණන ගාස්තු සඳහා වූ ගිණුම් ඉන්වොයිස් පත්‍රයේ දින සිට දින තිහක් ඇතුළත ගෙවා බේරුම් කළ යුතු ය.

(5) විගණනය කරනු ලබන ආස්ථිතියක් විසින් විගණන ගාස්තු ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් එකී ගාස්තු අය කර ගැනීම සඳහා විගණකාධිපතිවරයා විසින් වහාම මුදල් අමාත්‍යාංශය වෙත දැනුම් දිය යුතු අතර, අදාළ වන අවස්ථාවල දී අදාළ පළාත් සභාව වෙත ද, දැනුම් දෙනු ලැබිය යුතු ය.

(6) භාණ්ඩාගාර ලේකම්වරයා හෝ අදාළ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා විසින් අදාළ පාර්ශ්වයන් විමසා විගණනය කරනු ලබන ආස්ථිතියෙන් අය කර ගනු ලබන විගණන ගාස්තු, ජාතික අයවැය මත, භාණ්ඩාගාරය විසින් හෝ අදාළ පළාත් සභාව විසින් හඳුනා ගනු ලබන පළාත් අයවැයක් මත වන වැය ශීර්ෂයකින් ගෙවනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### අධිභාරයක් පැනවීම

විගණන කොමිෂන් සභාව විසින් අධිභාරයක් පැනවිය යුතු බව.

**19.** (1) (අ) වෙනත් යම් ලිඛිත නීතියක අන්‍යාකාරයකට විශේෂිතව දක්වා ඇත්නම් මිස, විගණනය කරනු ලබන ආස්ථිතියක යම් ගනුදෙනුවක් යම් ලිඛිත නීතියකට පටහැනිව සිදු කර ඇති බවටත් එම ගනුදෙනුව මගින් ඊට සම්බන්ධ තැනැත්තන්ගේ වංචාවක්, නොසැලකිල්ලක්, සාවද්‍ය පරිහරණයක් හෝ දූෂණයක් හේතු කොටගෙන යම් ඌනතාවක් හෝ පාඩුවක් සිදු වී ඇති බවටත් විශ්වාස කිරීමට විගණන සේවා කොමිෂන් සභාවට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී, යම් ගනුදෙනුවක් හේතු

කොටගෙන සිදු වූ සෑම ඌනතාවයකට ම හෝ පාඩුවකට ම අදාළ වටිනාකම, විගණන සේවා කොමිෂන් සභාව විසින්, අධිභාරයක් පැනවීම සඳහා එම ගනුදෙනුව හේතු කොටගෙන සිදු වූ සෑම ඌනතාවකට ම හෝ පාඩුවකට ම අදාළ වටිනාකම, එම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා වෙත වාර්තා කළ යුතු ය;

(ආ) මෙහි (අ) ඡේදයෙහි සඳහන් ඌනතාව හෝ පාඩුව සිදු කිරීමට සම්බන්ධ වූ යම් තැනැත්තකු මෙහි මින් මතු "ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) විනය බලධරයා විසින් ගනු ලබන විධිමත් විනය ක්‍රියාමාර්ගයකට හෝ අධිකරණ ක්‍රියාවලියකට පෙරාතුව, විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින්, යම් ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු යම් තැනැත්තකුගෙන් එක්ව හෝ වෙන් වෙන් ව, (1) වන උපවගන්තිය යටතේ වූ අධිභාරයක් අය කර ගනු ලැබිය යුතු ය.

(3) විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් ආපසු අය කර ගනු ලැබිය යුතු මුදල් ප්‍රමාණය අය කර ගැනීමේ දී පහත දැක්වෙන කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතු ය:–

(අ) අධිභාරයක් පැනවීම සඳහා තුඩු දුන් හේතු ද නිශ්චිතව සඳහන් කරමින්, අධිභාරයක් පැනවීමට නියමිත එක් එක් තැනැත්තා වෙත දැන්වීමක් නිකුත් කළ යුතු අතර, දැන්වීම ලද දිනයේ සිට දින විසි එකක කාලසීමාවක් ඇතුළත (1) වන සහ (2) වන උපවගන්ති සම්බන්ධයෙන් ලිඛිතව කරුණු දක්වමින් නියෝජන ඉදිරිපත් කිරීම සඳහා එම තැනැත්තන්ට අවස්ථාවක් ලබා දිය යුතු ය. ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් ඒ පිළිබඳව විගණන සේවා කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතු ය;

(ආ) අධිභාරයක් පැනවීම පිළිබඳ තීරණයක් ගැනීමට පෙර, (අ) ඡේදය යටතේ ඉදිරිපත් කරනු ලබන නියෝජන සලකා බැලිය යුතු ය;

(ඇ) නියමිත කාලය ඇතුළත කිසිදු නියෝජනයක් ඉදිරිපත් කර නැත්නම්, පැනවීමට නියමිත අධිභාරය පිළිබඳව තීරණයක් ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් ගනු ලැබිය යුතු ය;

(ඈ) ඌනතාවයේ හෝ පාඩුවේ සමුච්චිත මුදල් ප්‍රමාණය මත සහ ඌනතාවය හෝ පාඩුව සිදු කරන ලද අවස්ථාවේ දී භාණ්ඩාගාර බිල්පත් සඳහා අය කර තිබිය හැකි වූ පොළී අගය මත උපචිත වී තිබිය හැකි වූ එකී අගයන් අනුව අධිභාරය තීරණය කරනු ලැබිය යුතු ය;

(ඉ) (ආ) සහ (ඇ) ඡේද යටතේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් ගනු ලබන තීරණය, ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු එක් එක් තැනැත්තන්ට, පහත සඳහන් කරුණු විශේෂිතව සඳහන් කරමින් අධිභාර සහතිකයක් නිකුත් කිරීම මගින් දැනුම් දෙනු ලැබිය යුතු ය:–

(i) අධිභාරය පැනවීමට හේතුව;

(ii) ගනුදෙනුව හේතුවෙන් සිදු වූ ඌනතාවය හෝ පාඩුව මත නිශ්චය කරනු ලැබූ අධිභාරය සහ එම මුදල ගෙවීමට නිශ්චිතව දක්වා ඇති දිනය ඉක්ම වී මාස දෙකක් ප්‍රමාද වීම හේතුවෙන්, තීරණය කරනු ලැබිය හැකි යම් පොළී ප්‍රතිශතය ද ඇතුළත් වූ අය කර ගනු ලැබිය යුතු මුදල;

(iii) එය අය කර ගැනීම සඳහා ගනු ලැබීමට අදහස් කර සිටින ක්‍රියාමාර්ගය;

(iv) මෙහි (ii) වන අයිතමය යටතේ නිශ්චිතව සඳහන් මුදල ගෙවනු ලැබිය යුතු වන්නේ කුමන දිනයේ දී ද හෝ කුමන දිනයට පෙරද යන වග;

(v) ගෙවීම් කළ යුතු ආකාරය පිළිබඳ විස්තර.

(4) විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් 3 (ඉ) (ii) වන උපවගන්තිය යටතේ නිශ්චිතව සඳහන් මුදල, ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු තැනැත්තාගෙන්, ඔහු විගණනය සිදු කරන අවස්ථාවේ දී සේවයේ යෙදී සිටිය ද සේවයේ යෙදී නොසිටිය ද අධිභාර සහතිකයේ නිශ්චිතව දක්වා ඇති ගෙවීමේ දිනයේ සිට මාසයක් ඇතුළත අය කර ගත යුතු ය.

**20.** (1) 19 වන වගන්තිය යටතේ විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් කරන ලද තීරණයකින් අගතියට පත් යම් තැනැත්තකු විසින් අධිභාර සහතිකය ලැබුණු දින සිට එක් මාසයක් ඇතුළත එම තීරණයට එරෙහිව 21 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ අධිභාර අභියාචනා කමිටුව වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

අධිභාර අභියාචනා කමිටුව වෙත අභියාචනය කිරීම.

(2) අධිභාර අභියාචනා කමිටුව විසින්–

(අ) අභියාචනයට අවසර දීම;

(ආ) තීරණය සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම; හෝ

(ඇ) අභියාචනයට අවසර නොදීම,

කළ හැකි ය.

(3) (අ) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද තීරණය, අධිභාර අභියාචන කමිටුවේ සභාපතිවරයා හරහා අභියාචක වෙත සහ විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා වෙත සහ විගණන සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත, ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය;

(ආ) එසේ දැනුම් දීම නිකුත් කළ දිනයේ සිට මාසයක් ඇතුළත විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් වහාම තීරණය ක්‍රියාත්මක කර නැවත විගණන සේවා කොමිෂන් සභාව වෙත ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු ය.

(4) කමිටුවේ තීරණයකින් සෑහීමකට පත් නොවන යම් තැනැත්තකු, මේ වගන්තියේ 3 (ආ) උපවගන්තිය යටතේ එම දැනුම්

දීම නිකුත් කළ දිනයේ සිට වැඩ කරන දින තිහක් ඇතුළත, අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(5) විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් අභියාචනාධිකරණයේ නියෝගය, විගණන සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

අධිභාර අභියාචනා කමිටුව පත් කිරීම.

**21.** (1) (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිභාර අභියාචනා කමිටුවක් තිබිය යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එම කමිටුව සහ එහි සභාපති පත් කරනු ලැබිය යුතු ය. 20 වන වගන්තියේ සඳහන් කරනු ලැබූ තීරණයකින් අගතියට පත් යම් තැනැත්තකුගේ වන අභියාචනා විමසීම සහ තීරණයකට එළඹීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත්කරනු ලැබූ විගණනය, නීතිය හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය සහ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි පළපුරුද්දක් සහිත තැනැත්තන් අතරින් සාමාජිකයන් පස්දෙනකුට අඩු නොවන සංඛ්‍යාවකින් කමිටුව සමන්විත විය යුතු ය.

(2) ජාතික විගණන කාර්යාලයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ කිසිදු සාමාජිකයකු කමිටුවේ සාමාජිකයකු නොවිය යුතු ය. විගණකාධිපතිවරයා කමිටුවේ සාමාජිකයකු නොවිය යුතු ය. කමිටුව, විගණකාධිපතිවරයාගෙන් ස්වාධීනව කටයුතු කළ යුතු ය.

(3) එම කමිටුව විසින් අභියාචනයට අදාළ කාර්යය පටිපාටිය සහ අභියාචනයට අදාළ රීති නිශ්චය කළ යුතු අතර, ඒවා *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු ය.

අධිභාර වශයෙන් ගෙවනු ලබන මුදල් බැර කිරීම.

**22.** විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් අධිභාර වශයෙන් 19 (3) (ඉ) (ii) වගන්තිය යටතේ අය කර ගන්නා ලද සියලු මුදල් සහ උපචිත වූ පොළී මුදල් ඇත්නම් එම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අධිභාරය, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් වන ගනුදෙනුවකට අදාළව වන අවස්ථාවක දී, අධිභාරය වශයෙන් අය කරගනු ලැබූ මුදල අවස්ථාවෝචිත පරිදි පළාත් සභාවේ පළාත් අරමුදලට හෝ අදාළ පළාත් පාලන ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

**23.** (1) 19 (3) (ඉ) (ii) වගන්තිය යටතේ යම් අය කර ගනු ලැබිය යුතු මුදලක් නියමිත කාලය ඇතුළත ගෙවා නොමැති විට එය අය කර ගැනීමට වහාම කටයුතු කිරීම අවශ්‍ය යයි විගණන සේවා කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක දී, 20(1) වගන්තිය යටතේ අභියාචනා කමිටුව ඉදිරියේ හෝ 20(4) වගන්තිය යටතේ අභියාචනාධිකරණයෙහි අභියාචනයක් පවතින්නේ නම් මිස, විගණන සේවා කොමිෂන් සභාව විසින්, අය කර ගනු ලැබිය යුතු මුදලේ විස්තර ද, ඌනතාව හෝ පාඩුව සඳහා වගකිව යුතු තැනැත්තාගේ නම සහ ඔහු අවසන්වරට සේවය කළ ස්ථානය හෝ පදිංචි ස්ථානය ද දැක්වෙන සහතිකයක්, ඒ ස්ථානය පිහිටි කොට්ඨාසය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත, වැඩ කරන දින අනූවක කාලසීමාවක් තුළ නිකුත් කළ හැකි ය.

අය කර ගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍ය.

(2) (අ) එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් අය කර ගනු ලැබිය යුතු මුදල අය කර ගැනීම සඳහා එම තැනැත්තාට විරුද්ධව වැඩිදුර නීති කෘත්‍ය නොපැවැත්විය යුත්තේ මන්ද යන්නට කරුණු දැක්වීමට එම ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු තැනැත්තාව කැඳවනු ලැබිය යුතු ය;

(ආ) එවිට ප්‍රමාණවත් හේතු පෙන්වීමට ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු තැනැත්තා අපොහොසත් වුවහොත්, ඒ අය කර ගනු ලැබිය යුතු මුදල දඩයකින් පමණක් දඬුවම් කළ යුතු වරදක් ලෙසත්, බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් නොකළ යුතු වරදක් ලෙසත් ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු තැනැත්තාට එරෙහිව ඒ මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයක් මගින් පනවනු ලබන දඩයක් ලෙස සැලකිය යුතු ය.

(3) (අ) අය කර ගැනීමට ඇති මුදල යථා පරිදි තක්සේරු කර ඇති බවටත්, එකී මුදල (1) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලැබූ යම් නීති කෘත්‍යයක දී ගෙවීම පැහැර හැර ඇති මුදලක් බවටත්, විගණන සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද සහතිකය අවසානාත්මක සාක්ෂියක් විය යුතු ය;

(ආ) අවස්ථාවෝචිත පරිදි, 20(1) වන වගන්තිය යටතේ අධිභාර අභියාචනා කමිටුව වෙත හෝ 20(4) වගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම් මිස, මේ වගන්තිය යටතේ වූ නීති කෘත්‍යයක්

(1) වන උපවගන්තිය යටතේ වූ සහතිකය නිකුත් කළ දින සිට දින තිහක් ඇතුළත පවත්වනු ලැබිය යුතු ය.

(4) වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම්වලට යටත්ව, අදාළ විය යුතු අතර, එයට අමතරව ඒ දණ්ඩන නියමය පනවනු ලැබූ අවස්ථාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කළ හැකි වූ විධානයක් ඔහු විසින් කළ හැකි ය.

(5) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සිට (5) වන උපවගන්තිය තෙක් වූ විධිවිධාන කිසිවක්, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් අවස්ථාවකට අදාළ නොවිය යුතු ය.

(6) (2) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් අවස්ථාවක දී, දඩය නොගෙවා පැහැර හැරීමක දී, ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු තැනැත්තාව වසරකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට යටත් කරනු ලැබිය යුතු ය. ඒ දඩ මුදල ගෙවීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් කාලය ලබා දීම සිදු කළ හැකි ය. ඒ මුදල වාරික මගින් ගෙවන ලෙස විධාන කළ හැකි ය.

(7) මහෙස්ත්‍රාත්වරයකු විසින් යම් ගෙවීමක් වාරික මගින් ගෙවීමට නියම කරනු ලැබ තිබිය දී, ඉන් යම් වාරිකයක් නොගෙවා පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ වන විට නොගෙවා ඉතිරිව ඇති සියලුම වාරික ගෙවීම පැහැර හැර ඇත්තාක් සේ නීති කෘත්‍ය පැනවිය හැකි ය.

(8) මහෙස්ත්‍රාත්වරයාගේ තීරණයකින් අගතියට පත් යම් තැනැත්තකු විසින්, එම තීරණය ගනු ලැබූ දිනයේ සිට දින තිහක් ඉකුත් වීමට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(9) මෙහි (1) වන උපවගන්තිය යටතේ විගණන සේවා කොමිෂන් සභාව විසින් සහතිකයක් නිකුත් කරන කවර හෝ අවස්ථාවක, ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු තැනැත්තා වාසික හෝ, නිර්වාසික වුව ද, ඒ තැනැත්තා වෙත ඒ වෙලාවෙහි ම ඒ පිළිබඳ

නිවේදනයක්, පෞද්ගලික භාර කිරීමෙන් හෝ තැපෑලෙන් යවනු ලබන ලියාපදිංචි කළ ලිපියක් මාර්ගයෙන් හෝ ටෙලිමේල් සේවා මාර්ගයෙන් නිකුත් කළ යුතු ය. එහෙත් ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු තැනැත්තාට ඒ නිවේදනය නොලැබීම, මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බල රහිත වීමට හේතුවක් නොවිය යුතු ය.

(10) මේ පනතේ IV වන කොටසේ කාර්ය සඳහා, විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් වෙනත් යම් ලිඛිත නීතියකට පටහැනිව සිදුකරන ලද ගනුදෙනුවක දී වංචාව, නොසැලකිලිමත්කම, සාවද්‍ය පරිහරණය හෝ දූෂණය හේතුවෙන් යම් ඌනතාවක් හෝ පාඩුවක් ඇති කිරීමට හේතු වී ඇත්නම් හෝ ඒ සඳහා සම්බන්ධ වී ඇති බව විගණන සේවා කොමිෂන් සභාව විසින් හඳුනාගත් අවස්ථාවක දී, භාණ්ඩාගාර ලේකම්වරයා විසින්, 19 වන වගන්තියේ (3) (ඉ) (ii) උපවගන්තියේ දක්වා ඇති මුදල, එම විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයාගෙන් අය කර ගනු ලැබිය යුතු ය.

## V වන කොටස

## **විගණන සේවා කොමිෂන් සභාව**

**24.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153අ (1) ව්‍යවස්ථාව යටතේ (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විගණන සේවා කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර, එකී කොමිෂන් සභාව විගණකාධිපතිවරයාගෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන තවත් සාමාජිකයන් හතර දෙනකුගෙන් සමන්විත විය යුතු ය. විගණන සේවා කොමිෂන් සභාව පිහිටුවීම.

(2) කොමිෂන් සභාවට, එයට ම අයත් ලේකම් කාර්යාලයක් තිබිය යුතු ය.

**25.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඇ ව්‍යවස්ථාව යටතේ නිශ්චිතව දක්වා ඇති කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය වලට අමතරව කොමිෂන් සභාව විසින් - කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍යයන්.

(අ) කොමිෂන් සභාවේ කටයුතුවලට සහාය වීම සඳහා කමිටු පත් කරනු ලැබිය යුතු ය;

(ආ) 29 වන වගන්තියේ සඳහන් ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ක්‍රම හඳුන්වා දිය යුතු ය;

(ඇ) මේ පනතේ නිශ්චිත විධිවිධාන සලසා ඇති කරුණු සඳහා රීති සාදනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ රැස්වීම්.

**26.** (1) කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු අතර, ඔහු පැමිණ නොමැති විට, පැමිණ සිටින සාමාජිකයන් අතරින් තෝරාගනු ලබන සාමාජිකයකු විසින් රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය. කොමිෂන් සභාවේ සියලු තීරණ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් බහුතරයක් විසින් ගනු ලැබිය යුතු ය. ඡන්දවල සමානත්වයක් ඇති විට සභාපතිවරයා වශයෙන් රැස්වීමේ මුලසුන දරන සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම නොතකා ක්‍රියා කිරීමට කොමිෂන් සභාවට බලය ඇත. කොමිෂන් සභාවේ සාමාජිකයකුගේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව මත පමණක් හෝ සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුව මත පමණක් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක්, නීති කෘත්‍යයක් හෝ තීරණයක් අවලංගු නොවිය යුතු හෝ අවලංගු විය යුතු බවට සලකනු නොලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාව සෑම මසකම අවම වශයෙන් එක් වරක් හෝ රැස්විය යුතු ය.

(5) කොමිෂන් සභාවේ හදිසි රැස්වීමක් කැඳවීම සඳහා සාමාජිකයන් තිදෙනකුට අඩු නොවන පිරිසක්, ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට, කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හැකිතාක් ඉක්මනින් රැස්වීමක් කැඳවනු ලැබිය යුතු නමුත් එම ඉල්ලීම ලැබී දින දහයක් ඉක්මවීමට පෙර කැඳවනු ලැබිය යුතු ය.

(6) කොමිෂන් සභාවට, කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයකු සිටිය යුතු ය. ලේකම්වරයා විසින් කොමිෂන් සභාවේ රැස්වීම්වල වාර්තා නිසි පරිදි සටහන් තබා ගැනීම හා පවත්වාගෙන යාම සහ කොමිෂන් සභාවේ පොදු මුද්‍රාව සහ එහි භාරකාරත්වය පිළිබඳව වගකීම දැරිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස කාර්ය ඉටු කිරීමෙන් නිදහස් කිරීම.

**27.** (1) කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් තම කාර්ය ඉටු කිරීමෙන් නිදහස්ව සිටීමට ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයාට මාස දෙකකට වැඩි නොවන කාලයක් සඳහා අවසර දිය හැකි අතර එම කාලසීමාව සඳහා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153අ (1) ව්‍යවස්ථාවේ විධිවිධාන සැලකිල්ලට ගෙන, එම නිවාඩු ලබා සිටින කාලය සඳහා කොමිෂන් සභාවේ තාවකාලික සාමාජිකයකු ලෙස යම් තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය.

(2) ජනාධිපතිවරයාගේ පූර්ව අවසරය නොමැතිව කොමිෂන් සභාවේ එක දිගට රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජිකයකු එම තුන්වන රැස්වීමේ දින සිට ධුරය අත්හැර ගිය ලෙස සලකනු ලැබිය යුතු අතර ඉන් පසු කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නැවත පත්කිරීම සඳහා ඔහු නුසුදුස්සකු වන්නේ ය.

කොමිෂන් සභාවට නිලධරයන් සහ කාර්ය මණ්ඩලය පත් කිරීම, උසස් කිරීම ආදිය.

**28.** (1) කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලබන ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම කොමිෂන් සභාව සතු විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන නියම සහ කොන්දේසි මත, කොමිෂන් සභාව විසින් එම කොමිෂන් සභාවට සහ ජාතික විගණන කාර්යාලයට සුදුසුකම්ලත් ලේකම්වරයකු හා වෙනත් යම් නිලධරයන් සහ විගණන නොවන කාර්ය මණ්ඩලය පත්කරනු ලැබිය හැකි ය.

(3) ඒකාබද්ධ සේවයෙන් ජාතික විගණන කාර්යාලයට අනුයුක්ත කර ඇති තැනැත්තන් හැර, කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලබන තැනැත්තන්ගේ වැටුප් සහ වෙනත් දීමනා සහ වෙනත් යම් ප්‍රතිලාභ, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේ අදහස් ලබා ගැනීමෙන් අනතුරුව, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු අතර එකී වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය.

## VI වන කොටස

## ජාතික විගණන කාර්යාලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටුවීම

ජාතික විගණන කාර්යාලය පිහිටුවීම.

**29.** විගණකාධිපතිවරයාට තම කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී සහාය වීම පිණිස (මෙහි මින් මතු "විගණන කාර්යාලය" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික විගණන කාර්යාලයක් තිබිය යුතු අතර එය විගණකාධිපතිවරයාගෙන් සහ (මෙහි මින් මතු "විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනතේ 30 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට සහ විගණන නොවන කාර්ය මණ්ඩලයට අයත් සාමාජිකයන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයකින් සංයුක්ත විය යුතු ය.

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටුවීම.

**30.** (1) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය නම් වූ සේවාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වන දිනයෙහි ශ්‍රී ලංකා විගණන සේවයේ සහ විගණන පරීක්ෂකවරුන්ගේ සේවයේ සේවය කරන සාමාජිකයින් මේ පනත ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයින් ලෙස සලකනු ලැබිය යුතු ය.

විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු ඉල්ලා අස්වීම.

**31.** කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලැබූ විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු, කොමිෂන් සභාවේ සභාපතිවරයා අමතා තම අත්සන යටතේ වූ ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට අභියාචනය කළ හැකි බව.

**32.** 28 වන වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණයකින් අගතියට පත් යම් තැනැත්තකු විසින් එකී තීරණයට එරෙහිව 153ළ ව්‍යවස්ථාව යටතේ නිශ්චිතව සඳහන් පරිදි පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

නිලධාරීන් ස්ථානගත කිරීම.

**33.** (1) විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක, විගණනයක් සිදු කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයෙක් හෝ සුදුසුකම්ලත් විගණකවරයකු හෝ විගණකාධිපතිවරයා විසින් නීත්‍යානුකූලව සේවයේ යොදවනු ලබන වෙනත් යම් පුද්ගලයකු, ශ්‍රී ලංකාවේ කවර හෝ ප්‍රදේශයක සේවයේ යොදවනු ලැබිය හැකි ය.

(2) සියලුම විගණනය කරනු ලබන ආයතනයන් විසින් විගණකාධිපතිවරයාට සහ ඔහු විසින් සේවයේ යොදවා ඇති යම් නිලධරයකුට සහයෝගය දැක්විය යුතු අතර ඵලදායී විගණනයක් සිදු කිරීමට පහසුකම් සැලසීම සඳහා වැඩ කිරීමට අවශ්‍ය සුරක්ෂිත සහ රැකවරණ සහිත පරිසරයක් සකස් කර දිය යුතු ය.

ජාතික අයවැයෙහි ඇතුළත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් වාර්ෂික අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කළ යුතු බව .

**34.** මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත, විගණන කාර්යාලයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු කොමිෂන් සභාව විසින් සකස් කළ යුතු ය. එකී ඇස්තමේන්තු මුදල් අමාත්‍යවරයා සහ කොමිෂන් සභාවේ සභාපතිවරයා විමසීමෙන් පසු කථානායකවරයා විසින් තීරණය කරනු ලබන දිනයක කථානායකවරයාට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව කථානායකවරයාගෙන් ලැබීමෙන් වැඩකරන දින දහයක් ඇතුළත තම නිරීක්ෂණ කථානායකවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර කථානායකවරයා ඒ නිරීක්ෂණ ද සමග සමාලෝචනය කිරීම සඳහා එකී ඇස්තමේන්තු පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් විගණන කාර්යාලයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු සමාලෝචනය කිරීමෙන් පසු පාර්ලිමේන්තුව යෝග්‍ය යැයි සලකනු ලබන පරිදි, පසු වෙනස් කිරීම් තිබේ නම් ඒවා ද සමග, ජාතික අයවැයෙහි අන්තර්ගත කිරීම සඳහා ඇස්තමේන්තු මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

විගණකාධිපති වරයා විසින් වාර්ෂික කාර්ය වැඩසටහන ඉදිරිපත් කළ යුතු බව.

**35.** (1) විගණකාධිපතිවරයා විසින් එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින හැටකට පෙරාතුව, ඉදිරි වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ යෝජිත කාර්ය වැඩසටහන විස්තර කරන්නා වූ වාර්ෂික කාර්ය වැඩසටහන් කෙටුම්පතක් පිළියෙල කර කථානායකවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) වැඩසටහන් ප්‍රමුඛතා ද ඇතුළුව, යම් අදහස් හෝ සංශෝධන කැඳවීම සඳහා ස්ථාවර නියෝග යටතේ පිහිටුවනු ලැබූ පාර්ලිමේන්තු කමිටුවක් මගින් වාර්ෂික කාර්ය වැඩසටහන් කෙටුම්පත සමාලෝචනයට ලක් කිරීමට කථානායකවරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය. වාර්ෂික කාර්ය වැඩසටහන ලැබීමේ දින සිට දින තිහක් ඇතුළත එකී අදහස් හෝ සංශෝධන ඉදිරිපත් කරන ලෙස එකී කමිටුවට නියම කරනු ලැබිය හැකි ය. කථානායකවරයා විසින් එකී අදහස් හෝ සංශෝධන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සමාලෝචන කිසිවක් සිදු කර නොමැති විට දී, විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද කාර්ය වැඩසටහන කථානායකවරයා විසින් කෙළින්ම පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ සමාලෝචන සිදු කරනු ලබන අවස්ථාවක දී කථානායකවරයා හෝ එකී කමිටුව විසින් යෝජනා කළ පරිදි, අදහස් හෝ සංශෝධන සලකා බැලීමෙන් පසුව, එම කාර්ය වැඩසටහන විගණකාධිපතිවරයා විසින් සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(5) විගණකාධිපතිවරයා විසින්, සම්පූර්ණ කරන ලද වාර්ෂික කාර්ය වැඩසටහන එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමට පෙර, කථානායකවරයාට ඉදිරිපත් කළ යුතු අතර එවිට කථානායකවරයා විසින් එම කාර්ය වැඩසටහන පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු ය.

විගණන කාර්යාලය විගණනය කිරීම සඳහා සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයකු පත් කිරීමට ඇති බලය.

**36.** (1) වෙනත් යම් නීතියක විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන් වුවද, විගණන කාර්යාලයේ මුදල් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ, ගිණුම් සහ වෙනත් තොරතුරු විගණනය කිරීම සඳහා කථානායකවරයා විසින් සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයකු පත් කරනු ලැබිය යුතු අතර, මේ කාර්ය සඳහා විගණන කාර්යාලය, මේ පනත යටතේ විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් ලෙස සලකනු ලැබිය යුතු ය. විගණනය කරනු ලබන ආස්ථිත්‍යකට සහ විගණකාධිපතිවරයාට සිදු කර ඇති යම් සඳහනක්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව විගණන කාර්යාලය සහ සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයා සම්බන්ධයෙන්, අදාළ විය යුතු ය.

(2) මෙහි (1) වන උපවගන්තිය යටතේ සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයකු පත්කිරීම, එම විගණකවරයාට ගෙවනු ලබන පාරිශ්‍රමිකය ද ඇතුළුව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන යම් නියම හා කොන්දේසිවලට යටත් විය යුතු අතර එසේ ගෙවනු ලබන පාරිශ්‍රමිකය විගණන කාර්යාලයේ වියදම්වල කොටසක් වශයෙන් දැරිය යුතු ය.

(3) විගණනයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, එම සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයා විසින් එම වාර්තාව කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු අතර සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයා විසින් විගණනය කරන ලද අවස්ථාවේ දී විගණකාධිපතිවරයා විසින් ප්‍රකාශ කළ හැකිව තිබූ නිරීක්ෂණ හෝ අදහස් සමග කොමිෂන් සභාව විසින් එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු ය.

(4) සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයාගේ වාර්තාවට:-

(අ) මේ පනතේ 5 වන වගන්තියට අනුව සහ වෙනත් යම් ලිඛිත නීතියකට අනුකූලව පිළියෙල කළ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ; සහ

(ආ) 35 වන වගන්තිය යටතේ නියම කරන ලද වාර්ෂික කාර්ය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන යම් ගිණුමක්,

ඇතුළත් විය යුතු ය.

37. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) විගණන අරමුදල නමින් හැඳින්විය යුතු අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. විගණන අරමුදල.

(2) (අ) විගණන ගාස්තු වශයෙන් විගණකාධිපතිවරයා විසින් එකතු කරනු ලබන මුදලින් සියයට පහළොවක ප්‍රතිශතයක්;

(ආ) පාර්ලිමේන්තුවේ එකඟත්වය මත රජය විසින් බැර කරන ලද සියලු ගෙවීම්;

(ඇ) 50 වන වගන්තිය යටතේ වූ යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී අය කර ගනු ලැබූ යම් පිරිවැයක්,

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) 50 වන වගන්තිය යටතේ යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී දරන ලද යම් වියදමක්;

(ආ) අරමුදල පරිපාලනය කිරීමේ දී දරන ලද සියලු වියදම්;

(ඇ) මේ පනත යටතේ වූ ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීමේ දී විශේෂිත කාර්ය සාධනයක් පෙන්වා තිබෙන තැනැත්තන්ට ඒ වෙනුවෙන් සකස් කරන ලද රීතිවලට අනුව ප්‍රසාද දීමනා හෝ දිරිදීමනා වශයෙන් ලබා දෙන ලද සියලු ගෙවීම්,

අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) මුදල් වර්ෂයක් තුළ භාවිත නොකළ යම් මුදල් ප්‍රමාණයක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(5) 36 වන වගන්තිය යටතේ අරමුදලේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතු ය.

## VII වන කොටස

### ප්‍රධාන ගණන් දීමේ නිලධරයකුගේ සහ ගණන් දීමේ නිලධරයකුගේ වගකීම්

ප්‍රධාන ගණන් දීමේ නිලධරයකුගේ හෝ ගණන් දීමේ නිලධරයකුගේ වගකීම්.

**38.** (1) මේ පනතේ විධිවිධාන හෝ වෙනත් යම් ලිඛිත නීතියක අන්‍යාකාරයෙන් නිශ්චිතව සඳහන් කර ඇත්නම් මිස, මේ පනතේ කාර්ය සඳහා, විගණනය කරනු ලබන ආයතනයක ප්‍රධාන ගණන් දීමේ නිලධරයා හෝ ගණන් දීමේ නිලධරයා-

(අ) විගණනය කරනු ලබන ආයතනයේ විගණනය සාර්ථකව ඉටු කිරීමට විගණකාධිපතිවරයා සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබන එම විගණනය කරනු ලබන ආයතනයේ වගකිවයුතු නිලධරයා වන්නේ ය;

(ආ) මූල්‍ය සැලසුම්කරණය, අභ්‍යන්තර පාලනය, පොත්පත් හා ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යාම, මූල්‍ය කළමනාකරණය සහ කළමනාකරණ තොරතුරු සැපයීමේ ක්‍රමවේදය සඵලදායී ලෙස සිදුවන බවට සහතික විය යුතු ය;

(ඇ) එක් එක් ආයතනයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචන සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය;

(ඈ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආයතනයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධරයා වගබලා ගනු ලැබිය යුතු ය;

(ඉ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලු විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට සහතික විය යුතු ය;

(ඊ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික විය යුතු ය;

(උ) විගණකාධිපතිවරයාගේ අධිකාරයලත් නිලධරයන්ට නිසි පරිදි තම කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය කාර්යාල ඉඩකඩ හා පහසුකම් ප්‍රමාණවත් පරිදි ලබා දීම සිදු වන බවට සහතික විය යුතු ය; සහ

(ඌ) පැහැදිලිව පෙනෙන වංචාවක් හෝ යම් සාපරාධී ක්‍රියාවක් පිළිබඳව විගණකාධිපතිවරයා වෙතින් දැන්වීමක් ලැබුණු විට එම නීති විරෝධී හැසිරීම සම්බන්ධයෙන් හැකි විගස නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතනයකට පැමිණිල්ලක් කළ යුතු ය.

(2) මෙහි (1) උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් ප්‍රධාන ගණන් දීමේ නිලධරයකු විසින් ඉටු කළ යුතු සමාලෝචනය ලිඛිතව සිදු කළ යුතු අතර එහි පිටපත් විගණකාධිපතිවරයාට ලබා දිය යුතු ය.

විගණකාධිපති-වරයා විසින් ඉදිරිපත් කරන ලද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ප්‍රධාන ගණන් දීමේ නිලධරයා ඇතුළු නිලධරයන් විසින් සලකා බැලිය යුතු බව.

**39.** (1) අමාත්‍යාංශයක ප්‍රධාන ගණන් දීමේ නිලධරයා, දෙපාර්තමේන්තුවක ගණන් දීමේ නිලධරයා, අදාළ විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ පාලක මණ්ඩලය හෝ එහි ප්‍රධානියා විසින්, මෙහි 11 වන වගන්තියේ සඳහන් විගණකාධිපතිවරයාගේ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ලැබීමෙන් පසු, ඒ වාර්තාව සලකා බලා යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියා මාර්ග හෝ සැලකිල්ලට ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව විගණකාධිපතිවරයාට, භාණ්ඩාගාරයේ ලේකම්වරයාට සහ අදාළ අමාත්‍යවරයාට දැනුම් දිය යුතු ය.

(2) මෙහි (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග විගණනය කරනු ලබන ආස්ථිත්‍යය වෙත වාර්තා ඉදිරිපත් කර මාස

තුනක් ඇතුළත විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු අතර එම විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු ඇත්නම් ඒ පිළිබඳව හේතු ඉදිරිපත් කළ යුතු ය.

අභ්‍යන්තර විගණනය.

**40.** (1) අමාත්‍යාංශයක ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් එම අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයකු ද;එම අමාත්‍යාංශය යටතේ ඇති එක් එක් දෙපාර්තමේන්තුව සඳහා එහි ගණන් දීමේ නිලධරයා විසින් එම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම පිණිස සුදුසු විගණකවරයකු ද පත්කරනු ලැබිය යුතු අතර අනෙකුත් සියලු විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි අභ්‍යන්තර විගණන සිදු කිරීම සඳහා එම ආස්ථිත්‍යයේ පාලක මණ්ඩලය විසින් යථා පරිදි පත්කරනු ලබන තමාගේ ම අභ්‍යන්තර විගණකවරයකු සිටිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අභ්‍යන්තර විගණකවරයකු පත්කර නොමැති අවස්ථාවක දී මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට වසර දෙකක් නොඉක්මවන කාලසීමාවක් තුළ එම පත් කිරීම සිදු කළ යුතු ය.

(3) මේ පනතේ කාර්ය සඳහා (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන අභ්‍යන්තර විගණකවරයකු අවස්ථාවෝචිත පරිදි, ඍජුව ම ප්‍රධාන ගණන් දීමේ නිලධරයාට, ප්‍රධානියාට හෝ පාලක මණ්ඩලයට වාර්තා කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ අභ්‍යන්තර විගණකවරු විසින් ඉදිරිපත් කරනු ලැබූ සියලු වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

විගණන සහ කළමනාකරණ කමිටු.

**41.** (1) මෙහි (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් සෑම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් සඳහා ම අවස්ථාවෝචිත පරිදි, අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් හෝ ගණන් දීමේ නිලධරයා විසින් හෝ අදාළ පාලක මණ්ඩලය විසින් තමාට සහාය දීම පිණිස පත්කරනු ලබන විගණන සහ කළමනාකරණ කමිටුවක් තිබිය යුතු අතර, ඒ නාමය මගින් හෝ වෙනත් යම් නාමයකින් හඳුන්වනු ලබන කමිටුවක් විය හැකි අතර, එම කමිටුව, එක් එක් ආස්ථිත්‍යයෙහි ක්‍රියාකාරිත්වයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කිරීමේ කාර්යයෙහි නිරත විය යුතු අතර ප්‍රධාන ගණන් දීමේ නිලධරයා

වෙත හෝ ගණන් දීමේ නිලධරයා වෙත හෝ අදාළ පාලක මණ්ඩලය වෙත කලින් කලට වාර්තා කළ යුතු ය. එම කමිටුව විසින් විශේෂයෙන්-

(අ) ශ්‍රී ලංකාවේ සම්පත්වලට මූලිකත්වය ලබාදෙමින් එකී විගණනය කරන ලද ආස්ථිතාය විසින් භාර ගන්නා ලද නිශ්චිත ව්‍යාපෘතියක් හෝ වැඩසටහනකට හෝ අදාළව හෝ සමස්ථය වශයෙන් පූර්ව නිශ්චය කරගත් අරමුණු ළඟා කර ගැනීමේ පරමාර්ථයෙන් සම්පත් සකසුරුවම් ලෙස සහ කාර්යක්ෂමව භාවිත කර ඇති බවට සහතික වීම සහ විගණනය කරනු ලබන ආස්ථිතායේ සෑම විගණන සහ කළමනාකරණ අංශයක් ම සමාලෝචනය කිරීම සිදු කළ යුතු ය; සහ

(ආ) එකී ක්‍රියාකාරකම් සඳහා වෙන්කරන ලද අරමුදල් වියදම් කිරීම සඳහා, අවසරලත් කාලසීමාව තුළ එකී පරමාර්ථ සැබෑවටම අත්කර ගෙන තිබේ ද යන්න සහ නිම කළ ව්‍යාපෘති හෝ වැඩසටහන්, සැලසුම්වලින් අපේක්ෂිත වූ පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න නිර්ණය කිරීම සිදු කළ යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා (1) වන උපවගන්තියේ සඳහන් විගණනය කරන ලද ආස්ථිතියක්-

(අ) අමාත්‍යාංශයක්;

(ආ) පළාත් සභාවක්;

(ඇ) රාජ්‍ය සංස්ථාවක්;

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවක් හෝ විමර්ශනය කිරීමේ විශේෂ ජනාධිපති කොමිෂන් සභාවක්;

(ඉ) ජනාධිපති ලේකම් කාර්යාලය;

(ඊ) පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාගේ කාර්යාලය;

(උ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන සමාගමක්;

(ඌ) යම් ලිඛිත නීතියක් යටතේ රජයට පවරනු ලැබ ඇති යම් වෙළෙඳ ව්‍යාපාරයක් හෝ වෙනත් ව්‍යාපාරයක්; සහ

(එ) නීතිය මගින් හෝ වෙනත් ආකාරයෙන් පිහිටුවන ලද යම් සංස්ථාවක් හෝ සංස්ථාපිත මණ්ඩලයක්,

විය යුතු ය.

## VIII වන කොටස

### වැරදි සහ දණ්ඩන

විගණකාධිපතිවරයාට සහාය දැක්වීම පැහැර හැරීම වරදක් බව.

**42.** මේ පනත යටතේ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී විගණකාධිපතිවරයා විසින් හෝ ඔහුගේ අධිකාරයලත් කවර හෝ තැනැත්තකු විසින් ඉල්ලා සිටිනු ලබන යම් අවශ්‍යතාවක් විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් විසින් සම්පූර්ණ කරනු ලැබිය යුතු අතර-

(අ) යම් තොරතුරක්, ලේඛනයක්, පැහැදිලි කිරීමක්, වාර්තාවක් හෝ සාක්ෂියක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි විට, එම ඉල්ලීම ලද දින සිට වැඩ කරන දින විසි එකකට නොඅඩු කාල සීමාවක් තුළ එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ විට හෝ එය ලබා දීම ප්‍රතික්ෂේප කරන;

(ආ) විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටින ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට එසේ පෙනී සිටීම ප්‍රතික්ෂේප කරන හෝ එම විෂයය පිළිබඳ මනා අවබෝධයක් ඇති තැනැත්තකු නම් කිරීමට අපොහොසත් වන;

(ඇ) යම් ප්‍රකාශයක් හෝ ලේඛනයක් අසත්‍ය බවට හෝ නොමඟ යවන සුලු බවට දැන දැන ම විගණකාධිපතිවරයාට හෝ ඔහුගේ අධිකාරයලත් කවර හෝ තැනැත්තකුට එවැනි ප්‍රකාශයක් කරන හෝ ලේඛනයක් ඉදිරිපත් කරන;

(ඈ) විගණකාධිපතිවරයාගේ හෝ ඔහුගේ අධිකාරයලත් කවර හෝ තැනැත්තකුගේ කාර්ය සහ කර්තව්‍යවලට විරෝධතා දක්වන හෝ බාධා කරන,

සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

කොමිෂන් සභාවේ හෝ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ආදියේ යම් නිලධරයකුගේ තීරණයකට බලපෑම් කිරීම හෝ බලපෑම් කිරීමට තැත් කිරීම වරදක් බව.

43. (1) (අ) කොමිෂන් සභාවේ;

(ආ) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුගේ;

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකුගේ;

(ඈ) 36 වන වගන්තිය යටතේ පත් කරන ලද යම් සුදුසුකම්ලත් විගණකවරයකු; හෝ

(ඉ) මේ පනත යටතේ යම් කර්තව්‍යක් භාර ගැනීම සඳහා කොමිෂන් සභාව හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි යම් තැනැත්තකු,

යම් තීරණයකට, ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී හැර ඍජුව හෝ වක්‍රව, තමා ම හෝ වෙනත් තැනැත්තකු මගින් බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට තැත් කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම මහාධිකරණයකට ම (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති යම් කාරණයක් විභාග කොට තීන්දුවකට එළඹීමට අධිකරණ බලය ඇත්තේ ය.

පුද්ගල මණ්ඩල විසින් සිදු කරන වැරදි.

44. මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී -

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක් හෝ සංස්ථාවක් නම්, එම ආයතනයේ සෑම අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ අනුයෝජිතයකු ම; සහ

(ආ) එම පුද්ගල මණ්ඩලය සමාගමක් නම්, සෑම හවුල්කරුවකු ම,

පිළිවෙළින් 42 සහ 43 වන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති වැරදි සඳහා වන පරිදි දඬුවමකට යටත් විය යුතු ය:

එසේ වුව ද, එම සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයේ හෝ ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ අනුයෝජිතයකු හෝ එම සමාගමේ හවුල්කරුවකු, තම දැනුම නොමැතිව එම වරද සිදු කළ බවට නැතහොත් එම වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බවට ඔප්පු කරන්නේ නම් ඔහු එම වරද සඳහා වරදකරුවකු ලෙස සලකනු නොලැබිය යුතු ය.

වෙනත් වැරදි.

**45.** මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක් උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදුකරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

දඬුවම් දෙනු ලැබූ තැනැත්තන්ට ක්‍රියාවලිය තුළ වන වෙනත් වැරදි සඳහා දඬුවම් කළ යුතු බව.

**46.** මේ පනතේ විධිවිධාන යටතේ වරදකරුවකු කරනු ලැබූ යම් තැනැත්තකුට, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වූ ක්‍රියාවලියක් තුළ දී, සිදු කරනු ලැබූ වෙනත් යම් වරදක් සඳහා දඬුවම් දෙනු ලැබීමෙන් වළක්වනු නොලැබිය යුතු ය.

## IX වන කොටස

### සාමාන්‍ය

රාජ්‍ය විගණන පුහුණුව සහ සංවර්ධනය සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම.

**47.** (1) රාජ්‍ය මූල්‍ය සහ විගණන පිළිබඳ ක්ෂේත්‍රයේ මානව සම්පත් හැකියාව වැඩිදියුණු කිරීමේ අදහස ඇතිව විගණන කාර්යාලය යටතේ රාජ්‍ය විගණන පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මධ්‍යස්ථානයේ කළමනාකරණයට අදාළ රීති කොමිෂන් සභාව විසින් සකස් කළ යුතු ය.

**48.** (1) මේ පනත යටතේ රීති සෑදීමට බලය පවරා ඇති හෝ නියම කර ඇති කරුණු සියල්ල හෝ යම් කාරණයක් සම්බන්ධයෙන්, කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

රීති සෑදීමට කොමිෂන් සභාව සතු බලතල.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම එය ගැසට් පත්‍රයේ පළ කරන ලද දින සිට මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකළ සෑම රීතියක් ම ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**49.** විගණනයක් සිදු කරන විට ස්වකීය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් කලින් කල විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයට හෝ ඔහුගේ අධිකාරයලත් යම් නිලධරයකුට එවැනි සාමාන්‍ය සහ විශේෂ විධාන ලිඛිතව ලබා දිය යුතු අතර එම විධාන, කාර්ය මණ්ඩලය හෝ විගණකාධිපතිවරයාගේ අධිකාරයලත් යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

විගණකාධිපතිවරයා විසින් මාර්ගෝපදේශ නිකුත් කළ යුතු බව.

**50.** (1) මේ පනතේ විධිවිධාන යටතේ පනවන ලද හෝ පවරන ලද යම් කර්තව්‍යයක් හෝ බලතල ඉටු කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී සද්භාවයෙන් කරන ලද යමක් සඳහා විගණකාධිපතිවරයා, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකු, ජාතික විගණන කාර්යාලයේ යම් නිලධරයකු හෝ 9 (1) (අ) වගන්තියේ සඳහන් කරන ලද විගණකාධිපතිවරයාගේ කාර්යය ඉටු කිරීමේ දී සහාය වන වෙනත් යම් තැනැත්තකු කිසිදු සිවිල් හෝ අපරාධ වගකීමකට යටත් නොවන්නේ ය.

නඩුවලින් ආරක්ෂාව.

(2) මේ පනත යටතේ අවස්ථාවෝචිත පරිදි, විගණකාධිපතිවරයා, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකු, ජාතික විගණන කාර්යාලයේ යම් නිලධරයකු හෝ 8 (අ) වගන්තියේ සඳහන් විගණකාධිපතිවරයාගේ කාර්යය ඉටු කිරීමේ දී සහාය වන වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට ඔහුට එරෙහිව පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී දරනු ලබන යම් වියදමක්, එම වරද සිදු කරන

ලද්දේ සද්භාවයෙන් බවට අධිකරණය තීරණය කරන්නේ නම් එකී වියදම එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ම ඔහු විසින් අය කර ගනු ලැබුවේ නම් මිස, ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්, විගණන කාර්යාලයේ නිලධරයන් හා කාර්ය මණ්ඩලය රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**51.** කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන්, විගණන කාර්යාලයේ නිලධරයන් සහ කාර්ය මණ්ඩලය දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව විගණන කාර්යාලය උපලේඛනගත ආයතනයක් බවට සලකනු ලැබිය යුතු බව.

**52.** අල්ලස් පනතේ අර්ථානුකූලව විගණන කාර්යාලය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය.

1958 අංක 26 දරන පනත ඉවත් කිරීම.

**53.** 1958 අංක 26 දරන විගණකාධිපති ගාස්තු පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

අන්තර්කාලීන විධිවිධාන.

**54.** (1) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට විගණකාධිපති දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වීම අවසන් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානයෙහි කුමක් සඳහන් වුව ද—

(අ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, බලපවත්වන පරිදි විගණකාධිපති දෙපාර්තමේන්තුවේ බැරට ඇති සියලු මුදල්, එම දිනයේ සිට බලපවත්වන පරිදි මේ පනත යටතේ පිහිටුවන ලද විගණන කාර්යාලයට මාරු කරනු ලැබිය යුතු ය;

(ආ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, විගණකාධිපති දෙපාර්තමේන්තුව සතුව පැවති සහ එම දෙපාර්තමේන්තුවේ කාර්ය සඳහා භාවිත කරනු ලැබූ සියලු චංචල හා නිශ්චල දේපළ මත පවතින දේපළ අයිතිය සහ අනෙකුත් අයිතිවාසිකම් එම දිනයේ සිට බලපවත්වන පරිදි විගණන කාර්යාලය වෙත පවරනු ලැබිය යුතු ය;

(ඈ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, පැවති විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සියලු ණය, බැඳීම් හා බැරකම් එම දිනයේ සිට බලපවත්නා පරිදි විගණන කාර්යාලයේ ණය, බැඳීම් හා බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්යය සඳහා ඇතුළත් වී, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින සියලු කොන්ත්‍රාත් හා ගිවිසුම්, එම දිනයේ සිට බලපවත්වන පරිදි විගණන කාර්යාලයට ඇතුළත් වූ කොන්ත්‍රාත් හා ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඉ) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවතින සියලු නඩු හා නීති කෘත්‍යයන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට විගණන කාර්යාලය විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබූ නඩු හා නීති කෘත්‍යයන් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඊ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වාසියට හෝ ඊට එරෙහිව නිසි අධිකරණ බලය ඇති අධිකරණ විසින් ඇතුළත් කරනු ලැබූ හෝ කරනු ලැබ එම දිනයේ දී ඉටු නොකර පවතින සියලු තීන්දු ප්‍රකාශ සහ ආඥා එම දිනයේ සිට බලපවත්නා පරිදි විගණන කාර්යාලයේ වාසියට හෝ ඊට එරෙහිව ඇතුළත් කරනු ලැබූ හෝ කරනු ලැබූ තීන්දු ප්‍රකාශ සහ ආඥා ලෙස සලකනු ලැබිය යුතු අතර ඒවා ඒ අනුව බලාත්මක කරනු ලැබිය යුතු ය;

(උ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවති සහ මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන සෑම රීතියක් ම මේ පනත යටතේ සාදන ලද රීතියක් ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ඌ) සිදු කෙරෙමින් පවතින සියලුම විගණනයන් විගණකාධිපතිවරයා විසින් මේ පනත යටතේ අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ක්‍රියාවට නංවන පරිදි, විගණනය කරනු ලබන ආස්ථිත්‍යයකට අභ්‍යන්තර විගණකවරයකු පත්කරනු නොලබන අවස්ථාවක දී, අභ්‍යන්තර විගණක කර්තව්‍ය, එවැනි පත් කිරීමක් සිදුවන තෙක් කරගෙන යා යුතු ය.

(4) ජාතික විගණන කාර්යාලය පිහිටුවීමට පෙරාතුව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටි ශ්‍රී ලංකා විගණන සේවයේ සහ විගණන පරීක්ෂකවරුන්ගේ සේවයේ සාමාජිකයන්, ජාතික විගණන කාර්යාලයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම දිනයට පෙර ඉක්බිතිවම එම සේවකයාට අදාළ විය හැකි පරිදි ඊට සමාන නියම හා කොන්දේසි යටතේ සේවයේ නියුක්ත කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතුව සිටි සියලු ම නිලධාරීන්ට සහ කාර්ය මණ්ඩලයට සේවානියුක්තිය අර්පණය කිරීම පහත දැක්වෙන පරිදි සිදු වේ:-

(අ) මේ පනත ක්‍රියාත්මක වන දින සිට මාස තුනක් ඇතුළත, කොමිෂන් සභාව විසින්, මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විගණන සේවයේ සහ විගණන පරීක්ෂකවරුන්ගේ සේවයේ සේවා නියුක්තව සිටින සියලුම සාමාජිකයින්ට, සේවානියුක්තිය සඳහා අර්පණයක් කළ යුතු අතර මෙම අර්පණය කරනු ලබන දිනයේ දී අදාළ වන සේවානියුක්තියට වූ නියම හා කොන්දේසිවලට වඩා අඩු නොවන වාසිදායක නියම හා කොන්දේසි මත විය යුතු ය;

(ආ) මෙහි (අ) ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද අර්පණය එම අර්පණය කරනු ලැබූ දින සිට මාස දෙකක කාලයක් ගත වන තුරු විවෘතව පවතින අතර මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී විගණක කාර්යාලයේ සේවයට බැඳීමට කැමැත්ත පළකරන විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විගණන සේවයේ සහ විගණන පරීක්ෂකවරුන්ගේ සේවයේ සේවා නියුක්තව සිටින යම් සාමාජිකයකු ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයකු වන්නේ ය;

(ඈ) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් බඳවාගනු ලැබ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විගණන සේවයේ සහ විගණන පරීක්ෂකවරුන්ගේ සේවයේ සේවානියුක්තව සිටින සාමාජිකයකු හෝ විගණක නොවන කාර්ය මණ්ඩල සාමාජිකයකු විගණන කාර්යාලයේ සේවා නියුක්තිකයකු බවට පත් වන විට, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ම සේවා නියුක්තකයකු ලෙස රාජ්‍ය සේවයේ නියුක්තව සිටි එම නිලධරයාගේ සේවානියුක්තිය ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයකු ලෙස සේවා නියුක්තිය දැරූ කාලසීමාවක් ලෙස සලකනු ලැබිය යුතු අතර සේවානියුක්තියේ තත්ත්වය වෙනස් වීම මගින් ඒ නිලධරයාගේ රාජ්‍ය සේවයේ සේවා කාල පරිච්ඡේදයේ අඛණ්ඩභාවය ඛණ්ඩනය වීමක් සිදු නොවිය යුතු ය;

(ඈ) විගණන කාර්යාලයේ සේවය කිරීමට කැමැත්ත පළනොකරන, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විගණන සේවයේ සහ විගණන පරීක්ෂකවරුන්ගේ සේවයේ සේවානියුක්තව සිටින යම් සාමාජිකයකු හෝ විගණක නොවන කාර්ය මණ්ඩල සාමාජිකයකු විශ්‍රාම වැටුප් සංග්‍රහයේ විධිවිධාන යටතේ විශ්‍රාම යා හැකි ය. පත් කිරීම්, උසස් කිරීම් හා ස්ථාන මාරු කිරීම්වලට අදාළ කාර්ය පටිපාටි රීති කොමිෂන් සභාව විසින් සකස් කරන තුරු 2009 පෙබරවාරි මස 20 වන දින අංක 1589/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද කාර්ය පටිපාටි රීති අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට අදාළ විය යුතු ය;

(ඉ) විගණන කාර්යාලයේ සේවයේ නියුක්ත ඒකාබද්ධ සේවයේ හෝ යම් වෙනත් සේවයක සාමාජිකයකු, අදාළ ඒකාබද්ධ සේවයේ සේවා සංග්‍රහයේ නියම හා කොන්දේසිවලට යටත්ව ජාතික විගණන කාර්යාලයේ රැඳී සිටිය යුතු ය;

(ඊ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටි ඒකාබද්ධ සේවයේ සාමාජිකයකුට විගණන කාර්යාලයේ සේවය කිරීමට හෝ විගණන කාර්යාලයෙන්

පිටතට ස්ථාන මාරුවක් ලබා ගැනීමට අදාළ ඒකාබද්ධ සේවා සංග්‍රහයේ නියම හා කොන්දේසිවලට යටත් ව මනාපයක් තිබිය යුතු ය; සහ

(උ) විගණකාධිපතිවරයා විසින් සෘජුව සේවයට බඳවා ගනු ලැබ මේ පනත ක්‍රියාත්මක වන වේලාවේ දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සේවය කළ නිලධරයන් දෙපාර්තමේන්තු සේවය තුළ විගණන කාර්යාලයේ විගණන නොවන නිලධරයන් වශයෙන් සේවය කිරීමට කැමැත්ත ප්‍රකාශ කරන නිලධරයන්, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයෙන් පැහැදිලි ලෙස වෙන් විය යුතු ය.

අර්ථ නිරූපණය.

**55.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ —

"විගණකාධිපතිවරයාගේ අධිකාරයලත් කවර හෝ තැනැත්තකු" යන්නෙන්, විගණකාධිපතිවරයා විසින් නමින් හෝ ධූරයෙන්, ලිඛිතව පත් කරනු ලබන හෝ යම් කවරෙකුගේ හෝ සේවය ලබාගනු ලබන මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක් යටතේ ඔහු වෙත පවරනු ලැබ ඇති කර්තව්‍යයන් ඉටු කිරීම පිණිස, ජාතික විගණන කාර්යාලයේ රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයන් වන, සුදුසුකම්ලත් විගණකවරයකු වන හෝ අවශ්‍ය වන්නා වූ ක්ෂේත්‍රයක විශේෂඥභාවය සහිත වෙනත් යම් තැනැත්තකු අදහස් වන අතර එම පත්වීම අවසන් වන තුරු එම කර්තව්‍යයන් ඉටු කළ යුතු බව ද අදහස් වේ;

"විගණනය කරනු ලබන ආස්ථිත්‍යය" යන්නට-

(අ) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ කාර්යාල;

(ආ) ආණ්ඩුවේ සියලු ම දෙපාර්තමේන්තු;

(ඇ) ජනාධිපති ලේකම් කාර්යාලය;

(ඈ) අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය;

(ඉ) අධිකරණ සේවා කොමිෂන් සභාව;

(ඊ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව;

(උ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කරන ලද කොමිෂන් සභා සහ 1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනත මගින් පිහිටුවනු ලැබූ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා;

(ඌ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා;

(එ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්යාලය;

(ඒ) පළාත් සභා සහ පළාත් පාලන ආයතන;

(ඔ) රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත අරමුදල් හෝ මණ්ඩල;

(ඕ) යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ රජයට පවරනු ලැබ ඇති වෙළෙඳ ව්‍යාපාර හෝ වෙනත් ව්‍යාපාර;

(ක) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන යම් සමාගමක්,

ඇතුළත් වේ;

"විගණන ප්‍රමිති කමිටුව" යන්නෙන්, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව අදහස් වේ;

"ගණන් දීමේ නිලධරයා" යන්නෙන්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන සලසා ඇති පරිදි වෙනත් පිළිවෙළක් යොදා ඇත්නම් මිස, මුදල් රෙගුලාසිවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට ප්‍රධාන ගණන් දීමේ නිලධරයාට වහාම වගකිව යුතු වන සෑම දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ම අදහස් වේ;

"විගණකාධිපතිවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලැබූ විගණකාධිපතිවරයා අදහස් වේ;

"සමගාමී විගණන" යන්නට, ගනුදෙනුවක් සිදුවන අවස්ථාවේ මූල්‍ය ගනුදෙනු පරීක්ෂා කිරීම හෝ යම් සමාන්තර ගනුදෙනුවක් පරීක්ෂා කිරීම ඇතුළත් වේ;

"ප්‍රධාන ගණන් දීමේ නිලධරයා" යන්නට, වෙනත් යම් ලිඛිත නීතියක අන්‍යාකාරයකින් නිශ්චිතව විධිවිධාන සලසා ඇත්තේ නම් මිස-

(අ) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් එම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා ලෙස පත්කරනු ලැබූ එම අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 (4) වන ව්‍යවස්ථාවේ නිශ්චිත දක්වන ලද දෙපාර්තමේන්තුවක් භාරව කටයුතු කරන නිලධරයා; හෝ

(ඇ) (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි අමාත්‍යාංශයක ලේකම්වරයකු විසින් අධීක්ෂණය කරනු නොලබන වෙනත් යම් දෙපාර්තමේන්තුවක් හෝ ආස්ථිත්‍යයක් භාරව කටයුතු කරන නිලධරයා,

ඇතුළත් වේ;

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අදහස් වේ;

"මූල්‍ය ආයතනය" යන්නට-

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක්;

(ආ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව යම් බලපත්‍රලාභී විශේෂ බැංකුවක්;

(ඇ) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ අර්ථානුකූලව යම් බැංකු ආයතනයක්;

(ඇ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ අර්ථානුකූලව යම් ලියාපදිංචි මුල්‍ය සමාගමක;

(ඉ) 2000 අංක 56 දරන කල්බදු මුල්‍යකරණ සමාගම් පනතේ අර්ථානුකූලව යම් කල්බදු මුල්‍යකරණ සමාගමක්;

(ඊ) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද 2013, පෙබරවාරි 8 දිනැති, අංක 1796/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2013 අංක 1 දරන මුදල් තැරැව් කරන රෙගුලාසිවල අර්ථානුකූලව යම් මුදල් තැරැව්කරුවකු;

(උ) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ සහ (417 අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ අර්ථානුකූලව යම් ප්‍රාථමික ගනුදෙනුකරුවකු;

(ඌ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ අර්ථානුකූලව යම් රක්ෂණ සමාගමක්;

(එ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ අර්ථානුකූලව යම් රක්ෂණ තැරැව්කරුවකු සහ අලාභ ගැලපුම්කරුවකු;

(ඒ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ අර්ථානුකූලව යම් රක්ෂණ නියෝජිතයකු;

(ඔ) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක්;

(ඕ) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව යම් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු;

(ක) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව ඒකක භාරයක් මෙහෙයවීම සඳහා වන යම් කළමනාකරණ සමාගමක්; සහ

(ග) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව වෙළඳපළ අතරමැදියකු ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන යම් තැනැත්තකු,

ඇතුළත් වේ;

"පාලන මණ්ඩලය" යන්නෙන්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ආස්ථිත්‍යයක කටයුතු පරිපාලනය සහ කළමනාකරණය භාර මණ්ඩලයක් හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ ලියාපදිංචි කරන ලදැයි සලකනු ලැබිය හැකි, එහි කොටස්වලින් සියයට පනහක ප්‍රතිශතයක හෝ ඊට වැඩි ප්‍රමාණයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් දරන යම් සමාගමක් අදහස් වේ;

"ප්‍රධානියා" යන්නෙන්, අමාත්‍යාංශයක් යටතේ එන දෙපාර්තමේන්තුවක ප්‍රධානියා අදහස් වේ;

"තොරතුරු" යන්නට, ඉලෙක්ට්‍රොනික ක්‍රමවලින් ජනනය කරන ලද දත්ත ද ඇතුළත්ව යම් වාචික හෝ ලිඛිත සාක්ෂ්‍යයක් ඇතුළත් විය යුතු ය;

"පළාත් පාලන ආයතන" යන්නෙන්, එවැනි යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් මගින් ක්‍රියාත්මක කරන බලතල, කාර්යයන් සහ කර්තව්‍යය ක්‍රියාත්මක කරන, ඉටුකරන හෝ සිදු කරන කාර්යයන්ට සමාන හෝ අනුරූපී බලතල ක්‍රියාත්මක කිරීම කාර්යයන් කිරීම සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා යම් නීතියක් යටතේ හෝ යම් නීතියක් මගින් නිර්මාණය කරන ලද හෝ පිහිටුවන ලද යම් ආයතනයක් ඇතුළුව මහ නගර සභා, නගර සභා හෝ ප්‍රාදේශීය සභා අදහස් වේ;

"විගණන නොවන කාර්ය මණ්ඩලය" යන්නෙන්, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විගණන සේවයේ සහ විගණක පරීක්ෂකවරුන්ගේ සේවයේ නියුක්ත සාමාජිකයන් හැර අනෙකුත් සාමාජිකයන් ද, මේ පනත ක්‍රියාත්මකවීමෙන් පසු කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලැබූ තැනැත්තන් හැර අන් තැනැත්තන් අදහස් වන අතර ඊට ඒකාබද්ධ සේවයට අනුයුක්ත කාර්ය මණ්ඩලය ද ඇතුළත් වේ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව පළාතක් සඳහා පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යනුවෙන් ප්‍රදානයක්, ණයක් මගින් හෝ අන්‍යාකාරයෙන් රජය විසින් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් සපයන ලද අරමුදල් හෝ ප්‍රාග්ධනය සමග, 2007 අංක 7 දරන සමාගම් පනත හැර යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවන යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් සමාගමක් අදහස් වේ;

"සම්පත්" යන්නට, රාජ්‍ය මුල්‍ය, රාජ්‍ය දේපළ, මානව, භෞතික හෝ ස්වභාවික සම්පත් සහ රාජ්‍ය ණය ඇතුළත් වේ;

"ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති" යන්නෙන්, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ නිශ්චිතව සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අදහස් වේ;

"ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති" යන්නෙන්, 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (3) වන වගන්තිය යටතේ සහ 12 වන වගන්තිය යටතේ මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් කලින් කලට නිකුත් කරනු ලබන සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ විධිවිධාන යටතේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති අදහස් වේ;

"ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(ආ)(2) ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය අදහස් වේ; සහ

"ගනුදෙනුව" යන්නෙන්, මුදල් ව්‍යාපාරයක් හෝ මුදල් නොවන ව්‍යාපාරයක් සම්බන්ධ යම් ක්‍රියාවක් සහ දේපළක් සම්බන්ධයෙන් වන විට–

(අ) මිලට ගැනීමක්, විකිණීමක්, ණයක්, අය කිරීමක්, උකසක්, ලියන් අයිතියක්, ඔඩපනයක්, මාරුකිරීමක්, භාරදීමක්, පැවරීමක්, ප්‍රතිනිවේදනයක්, සම්ප්‍රේෂණයක්, ත්‍යාගයක්, පරිත්‍යාගයක්, භාරයක් ඇති කිරීමක්, නිරවුල් කිරීමක්, යම් භාණ්ඩයක් තැන්පත් කිරීම ද ඇතුළු තැන්පතුවක්, මුදල් ආපසු ගැනීමක්, වත්කම් අතර මාරුවක්, බැර දිගු කිරීමක්;

(ආ) ඇටෝර්නි බලය පිළිබඳ යම් නියෝජ්‍යත්වයක් හා ප්‍රදානයක්;

(ඇ) වර්තමානයේ දී හෝ අනාගතයේ දී යම් දේපළකට සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසකට සතුවන හෝ සම්භාව්‍ය වන යම් අයිතියක්, හිමිකමක්, සම්බන්ධතාවක් හෝ වරප්‍රසාදයක් යම් තැනැත්තකු වෙත පැවරීමේ ප්‍රතිඵලය ඇති කරවන කවර ආකාරයකින් හෝ විස්තරයකින් හෝ ස්වභාවයකින් කෙසේ හෝ විස්තර කරන ලද දේපළ පිළිබඳ වෙනත් යම් පවරාදීමක් හෝ ඒ දේපළ පිළිබඳව කටයුතු කිරීමක්,

ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**56.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය

(9ඇ වගන්තිය)

**රහස්‍යභාවය පිළිබඳ දිවුරුම**

**2018 අංක .................. දරන ජාතික විගණන පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව**

...................................................................................... වන මම, විගණන සේවා කොමිෂන් සභාවෙහි සාමාජිකයකු වශයෙන්/...................................................................................* හි සේවා නියුක්තයකු වශයෙන්, හෝ 8(අ) වන වගන්තියෙහි සඳහන් කරනු ලබන පරිදි විගණකාධිපතිවරයාගේ කාර්යයන් ඉටු කිරීමේ දී සහාය දක්වන විශේෂඥ තැනැත්තකු වශයෙන්,

(අ) අධිකරණයක් විසින් නියම කරනු ලැබූ විට දී හැර;

(ආ) පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලැබූ විට දී හැර; හෝ

(ඇ) 2018 අංක ........ දරන ජාතික විගණන පනතේ 9 (ආ) වගන්තියට යටත්ව යම් ලිඛිත නීතියක් යටතේ නිශ්චිතව දක්වා ඇති විට දී හැර,

එම තොරතුරු රජයේ හෝ පෞද්ගලික අංශයේ කවර හෝ තැනැත්තකුට කවර හෝ ආකාරයකින් හෙළිදරව් නොකරන බවටත්, ඒ පිළිබඳව සාකච්ඡා නොකරන බවටත් හෝ ඒවා ප්‍රකාශ නොකරන බවටත් මම ගාම්භීරතා පූර්වකව ප්‍රකාශ කර ප්‍රතිඥා දෙමි/දිවුරා ප්‍රකාශ කරමි.

මෙහි දක්වා ඇති වගකීම මගින් ............................................................................* හි මා ධුරය දරන කාලය තුළ මා බැඳී සිටින අතර මේ යටතේ මගේ බැඳීම් කඩකිරීමක් නොවන හේතුවක් මත මහජනතාව අතර, ප්‍රසිද්ධියට පත් වී ඇති කරුණකට අදාළ ව මිස, මාගේ සේවා කාලය අවසන් වීමෙන් පසුව ද එසේ බැඳී සිටින බව ප්‍රකාශ කරමි.

මෙම දිවුරුමට/ ප්‍රතිඥාවට දෙදහස් .......... මස ........ දින මා විසින් අත්සන් තබන ලදී.

........................................
අත්සන.

20 ....................................... දින මෙම දිවුරුම/ ප්‍රතිඥාව දෙන ලදී.

මා ඉදිරිපිට දී ය.

........................................
කථානායක/ විගණකාධිපති.

* ජාතික විගණන කාර්යාලය/විගණකාධිපති දෙපාර්තමේන්තුව/ඒකාබද්ධ සේවය

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.